" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

SLSI ISO 9001 SYSTEM CERTIFIED

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| | | |
|---|---|---|
| ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary | දුරකථන / தொலைபேசி / Telephone | - 011 - 2092599 |
| | ෆැක්ස් / பெக்ஸ் / Fax | - 011 - 2092601 |
| | ඊ-මේල් / மின்னஞ்சல் / E-mail | - chiefsecretary@wpc.gov.lk |
| පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone | | 011 - 2093000 |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/05-2023 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | |
| දිනය / திகதி / Date | 2023.08.4 | | |

**පාලන චක්‍රලේඛ : 05/2023**

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),

ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),

සභා ලේකම් (බ.ප.),

ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),

පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),

<u>බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කුසලානය - 2023</u>

බස්නාහිර පළාත් සභාව තුළ සේවය කරනු ලබන 87,000 කට අධික රාජ්‍ය නිලධාරීන්ගේ වෙහෙසකාරී දිවියට මඳ ඉසිඹුවක් සහ මානසික සුවයක් ලබා දීම උදෙසාද, පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ ස්වාභාවික ක්‍රීඩා කෞශල්‍යය ඔප් නැංවීම උදෙසාද, පළාතේ අන්තර් ආයතන මට්ටමින් "ආණ්ඩුකාරවර කුසලානය - 2023" ක්‍රීඩා තරඟාවලිය පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

02. රාජ්‍ය මුදල් භාවිතයකින් තොරව සම්පූර්ණයෙන්ම අනුග්‍රාහක දායකත්වය මත සිදු කෙරෙන තරඟාවලියක් හා වර්ණ රාත්‍රියක් ලෙස මෙය පැවැත්වීමට නියමිතය.

03. "ආණ්ඩුකාරවර කුසලානය - 2023" ක්‍රීඩා තරඟාවලිය පහත ඉසව්වලින් සමන්විත වේ.

**පවත්වනු ලබන ක්‍රීඩා**

- ක්‍රිකට් - කාන්තා / පිරිමි
- වොලිබෝල් - කාන්තා / පිරිමි
- කබඩි ඇදීම - කාන්තා / පිරිමි
- නෙට්බෝල් - කාන්තා
- එල්ලේ - කාන්තා / පිරිමි

- බැඩ්මින්ටන්(ඒකල) - කාන්තා / පිරිමි
- බැඩ්මින්ටන්(යුගල) - මිශ්‍ර
- කැරම් (ඒකල) - කාන්තා / පිරිමි
- කැරම් (යුගල) - මිශ්‍ර
- හෙල්ල විසි කිරීම - කාන්තා / පිරිමි
- කව පෙත්ත විසි කිරීම - කාන්තා / පිරිමි
- යගුලිය දැමීම - කාන්තා / පිරිමි
- දුර පැනීම - කාන්තා / පිරිමි
- උස පැනීම - කාන්තා / පිරිමි
- 100m (40 න් ඉහළ) - කාන්තා / පිරිමි
- 100m (40 න් පහළ) - කාන්තා / පිරිමි
- 200m (40 න් ඉහළ) - කාන්තා / පිරිමි
- 200m (40 න් පහළ) - කාන්තා / පිරිමි
- 400m (40 න් ඉහළ) - කාන්තා / පිරිමි
- 400m (40 න් පහළ) - කාන්තා / පිරිමි
- 100m x 4(40 න් ඉහළ) - කාන්තා / පිරිමි
- 100m x 4(40 න් පහළ) - කාන්තා / පිරිමි
- 200m x 4(40 න් ඉහළ) - කාන්තා / පිරිමි
- 200m x 4(40 න් පහළ) - කාන්තා / පිරිමි
- තරඟ ඇවිදීම(40න් පහළ)- කාන්තා / පිරිමි
- තරඟ ඇවිදීම(40න් ඉහළ)- කාන්තා / පිරිමි

ඉහත තරඟ ඉසව් පහත සඳහන් ආයතන මඟින් සංවිධානය කෙරේ.

| අනු අංකය | පවත්වනු ලබන ක්‍රීඩාව | කාන්තා/ පිරිමි | සංවිධානය කරන ආයතනය/ දෙපාර්තමේන්තුව | සහභාගි විය හැකි ක්‍රීඩකයින් සංඛ්‍යාව | අතිරික්ත ක්‍රීඩකයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1. | ක්‍රිකට් | කාන්තා / පිරිමි | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය | 11 | 3 |
| 2. | වොලිබෝල් | කාන්තා / පිරිමි | ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය | 6 | 8 |
| 3. | කඹ ඇදීම | කාන්තා / පිරිමි | කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 8 | 2 |
| 4. | නෙට්බෝල් | කාන්තා | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | 7 | 5 |
| 5. | එල්ලේ | කාන්තා / පිරිමි | අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය | 16 | 4 |
| 6. | බැඩ්මින්ටන් (ඒකල) | කාන්තා / පිරිමි | තොරතුරු තාක්ෂණ හා සම්පත් සංවර්ධන අධිකාරිය | | |
| 7. | බැඩ්මින්ටන් (යුගල) | මිශ්‍ර | | 5 | 2 |
| 8. | කැරම් (ඒකල) | කාන්තා / පිරිමි | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 5 | 2 |
| 9. | කැරම් (යුගල) | මිශ්‍ර | | | |
| 10. | හෙල්ල විසි කිරීම | කාන්තා / පිරිමි | පළාත් පාලන දෙපාර්තමේන්තුව | | |
| 11. | කව පෙත්ත විසි කිරීම | කාන්තා / පිරිමි | | | |
| 12. | යගුලිය දැමීම | කාන්තා / පිරිමි | | | |
| 13. | දුර පැනීම | කාන්තා / පිරිමි | | | |
| 14. | උස පැනීම | කාන්තා / පිරිමි | | | |
| 15. | 100 m (40 න් ඉහළ) | කාන්තා / පිරිමි | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය | | |
| 16. | 100 m (40 න් පහළ) | කාන්තා / පිරිමි | | එක් ඉසව්වක් සඳහා ආයතනයකින් 3 දෙනෙකි. (සහය තරඟ හැර) | |
| 17. | 200m (40 න් ඉහළ) | කාන්තා / පිරිමි | | | |
| 18. | 200m (40 න් පහළ) | කාන්තා / පිරිමි | | | |
| 19. | 400m (40 න් ඉහළ) | කාන්තා / පිරිමි | | | |
| 20. | 400m (40 න් පහළ) | කාන්තා / පිරිමි | | | |
| 21. | 100m*4 (40 න් ඉහළ) | කාන්තා / පිරිමි | | එක් ආයතනයකින් සහය කණ්ඩායම් 01 (පි/කා) එක් කණ්ඩායමකට 04 | 02 |
| 22. | 100m*4 (40 න් පහළ) | කාන්තා / පිරිමි | | | |
| 23. | 200m*4 (40 න් ඉහළ) | කාන්තා / පිරිමි | | | |
| 24. | තරඟ ඇවිදීම (40න් ඉහළ) | කාන්තා / පිරිමි | | එක් ආයතනයකින් 05 (පි/ කා) | |
| 25. | තරඟ ඇවිදීම (40න් පහළ) | කාන්තා / පිරිමි | | | |

04. එක් එක් ඉසව්වක් නිම වූ පසු ශූරතා, අනු ශූරතා විනිශ්චය මණ්ඩල ඇගයීම අනුව දක්ෂතම ක්‍රීඩකයන් ආදීන්ට කුසලාන හා පදක්කම් පිරිනැමීමද, පළාත් වර්ණ පිරිනැමීමද තෝරා ගත් දිනකදී පළාත් වර්ණ රාත්‍රියේදී සිදු කෙරෙනු ඇත.

05. අදාළ ඉසව් සඳහා බස්නාහිර පළාත් සභාව නියෝජනය කරමින් සහභාගි විය හැකි ආයතනගත කණ්ඩායම් පහත පරිදි වේ.

**සහභාගී විය හැකි කණ්ඩායම් -**

1. ප්‍රධාන ලේකම් කාර්යාලීය කණ්ඩායම
2. අධ්‍යාපන අමාත්‍යාංශ කණ්ඩායම
3. සෞඛ්‍ය අමාත්‍යාංශ කණ්ඩායම
4. පළාත් පාලන අමාත්‍යාංශ කණ්ඩායම
5. ප්‍රවාහන අමාත්‍යාංශ කණ්ඩායම
6. කෘෂිකර්ම අමාත්‍යාංශ කණ්ඩායම
7. අධ්‍යාපන දෙපාර්තමේන්තු කණ්ඩායම
8. පළාත් පාලන දෙපාර්තමේන්තු කණ්ඩායම
9. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු කණ්ඩායම
10. සමාජ සේවා දෙපාර්තමේන්තු කණ්ඩායම
11. පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තු කණ්ඩායම
12. පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු කණ්ඩායම
13. කෘෂිකර්ම දෙපාර්තමේන්තු කණ්ඩායම
14. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තු කණ්ඩායම
15. වාරි මාර්ග දෙපාර්තමේන්තු කණ්ඩායම
16. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු කණ්ඩායම
17. සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තු කණ්ඩායම
18. කර්මාන්ත දෙපාර්තමේන්තු කණ්ඩායම
19. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාල කණ්ඩායම
20. නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තු කණ්ඩායම
21. ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තු කණ්ඩායම
22. පළාත් ආදායම් දෙපාර්තමේන්තු කණ්ඩායම
23. අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරි කණ්ඩායම
24. සංචාරක මණ්ඩල කණ්ඩායම
25. ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශ කණ්ඩායම
26. තොරතුරු සම්පත් සංවර්ධන අධිකාරි කණ්ඩායම
27. සෞන්දර්ය නිකේතන කණ්ඩායම
28. කෘෂි සේවා අධිකාරි කණ්ඩායම
29. කර්මාන්ත සංවර්ධන අධිකාරි කණ්ඩායම
30. පළාත් මාර්ග සංවර්ධන අධිකාරි කණ්ඩායම
31. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි කණ්ඩායම
32. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කණ්ඩායම
33. සමූපකාර සේවක කොමිෂන් සභා කණ්ඩායම

34. කොළඹ අධ්‍යාපන කලාප කාර්යාල කණ්ඩායම
35. ජයවර්ධනපුර අධ්‍යාපන කලාප කාර්යාල කණ්ඩායම
36. පිළියන්දල අධ්‍යාපන කලාප කාර්යාල කණ්ඩායම
37. හෝමාගම අධ්‍යාපන කලාප කාර්යාල කණ්ඩායම
38. හොරණ අධ්‍යාපන කලාප කාර්යාල කණ්ඩායම
39. මතුගම අධ්‍යාපන කලාප කාර්යාල කණ්ඩායම
40. කළුතර අධ්‍යාපන කලාප කාර්යාල කණ්ඩායම
41. ගම්පහ අධ්‍යාපන කලාප කාර්යාල කණ්ඩායම
42. මිනුවන්ගොඩ අධ්‍යාපන කලාප කාර්යාල කණ්ඩායම
43. මීගමුව අධ්‍යාපන කලාප කාර්යාල කණ්ඩායම
44. කැළණිය අධ්‍යාපන කලාප කාර්යාල කණ්ඩායම
45. කොළඹ දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාල කණ්ඩායම
46. කළුතර දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලකණ්ඩායම
47. ගම්පහ දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාල කණ්ඩායම
48. කොළඹ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල කණ්ඩායම
49. කළුතර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල කණ්ඩායම
50. ගම්පහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල කණ්ඩායම
51. කොළඹ දිස්ත්‍රික් නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම කාර්යාල කණ්ඩායම
52. කළුතර දිස්ත්‍රික් නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම කාර්යාල කණ්ඩායම
53. ගම්පහ දිස්ත්‍රික් නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම කාර්යාල කණ්ඩායම

06. කණ්ඩායම් සැකසීමේ විශේෂ කොන්දේසි පහත පරිදි වේ.

- ප්‍රධාන ලේකම් කාර්යාලීය කණ්ඩායමට සියළුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාල, සභා ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, මොරන්න මානව සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය හා අභ්‍යන්තර විගණන අංශයන්හි කාර්ය මණ්ඩලවලින් සමන්විත විය යුතුය.

- අමාත්‍යාංශ කණ්ඩායම් සඳහා ඒ ඒ අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක විවිධ අංශවල කාර්ය මණ්ඩල, අදාල අමාත්‍යාංශ වෙනුවෙන් බාහිර කාර්යාලවල අමාත්‍යාංශයේ ඍජු අධීක්ෂණය යටතේ සේවය කරන කාර්ය මණ්ඩලද ඇතුලත්ව සමන්විත විය යුතුය. කිසිදු අමාත්‍යාංශ කණ්ඩායමකට ඒ ඒ අමාත්‍යාංශ යටතේ ඇති දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩල නිලධාරීන් සහභාගී නොවිය යුතුය.

- දෙපාර්තමේන්තු කණ්ඩායම් සඳහා ඒ දෙපාර්තමේන්තුව යටතේම සේවය කරන කාර්ය මණ්ඩල පමණක් සහභාගී වියයුතු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයට අනුයුක්ත කර ඇති ඒ ඒ දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩලද කණ්ඩායම් සඳහා යොදවා ගත හැක.

- ව්‍යවස්ථාපිත ආයතන කණ්ඩායම් ඒ ඒ කාර්යමණ්ඩල යටතේ සම්බන්ධ විය යුතුය.

- අධ්‍යාපන කලාප කාර්යාල කණ්ඩායම් සඳහා ඒ ඒ කලාපයට අයත් කොට්ඨාස කාර්යාල, පාසල්වල කාර්ය මණ්ඩල ද සහභාගී විය හැකි අතර වෙනත් කලාපයකට කිසියම් අයුරින් සම්බන්ධිත කිසිදු නිලධාරියකු වෙනත් කලාප කණ්ඩායමක් නියෝජනය නොකළ යුතුය.

- සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාල කණ්ඩායම් සඳහා ඒ ඒ දිස්ත්‍රික්කය නියෝජනය කරන මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා කාර්ය මණ්ඩලද සහභාගී විය හැකි අතර වෙනත් දිස්ත්‍රික්කයකට අයත් කිසිදු නිලධාරියකු වෙනත් දිස්ත්‍රික් කණ්ඩායමක් නියෝජනය නොකළ යුතුය.

- ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල කණ්ඩායම් සඳහා ඒ ඒ දිස්ත්‍රික්කය නියෝජනය කරන සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්ය මණ්ඩලද පළාත් සභා රෝහල් හා ප්‍රාථමික වෛද්‍ය ඒකක කාර්ය මණ්ඩලද සහභාගී විය හැකි අතර, වෙනත් දිස්ත්‍රික්කයකට අයත් කිසිදු නිලධාරියකු වෙනත් දිස්ත්‍රික් කණ්ඩායමක් නියෝජනය නොකළ යුතුය.

- නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම කාර්යාල කණ්ඩායම් සඳහා ඒ ඒ දිස්ත්‍රික්කයට අයත් ගොවිපළවල් හා විවිධ නිෂ්පාදන හා අලෙවි ආයතන කාර්ය මණ්ඩලද සහභාගි විය හැකි අතර, වෙනත් දිස්ත්‍රික්කයකට අයත් කිසිදු නිලධාරියෙකු වෙනත් දිස්ත්‍රික් කණ්ඩායමක් නියෝජනය නොකළ යුතුය.

- කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන වල කාර්ය මණ්ඩල කෘෂිකර්ම දෙපාර්තමේන්තු කණ්ඩායම නියෝජනය විය යුතුය.

- පළාත් ආයුර්වේද රෝහල් හා ආයුර්වේද බෙහෙත් ශාලා කාර්ය මණ්ඩල පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු කණ්ඩායම නියෝජනය විය යුතුය.

- කර්මාන්ත මධ්‍යස්ථාන කාර්ය මණ්ඩල කර්මාන්ත දෙපාර්තමේන්තු කණ්ඩායම නියෝජනය කළ යුතුය.

- විවිධ නිෂ්පාදන හා අලෙවි ආයතන කාර්ය මණ්ඩල ඒ ඒ දෙපාර්තමේන්තුවට අයත් කණ්ඩායම් නියෝජනය කළ යුතුය.

- පුනරුත්ථාපන හා රැඳවුම් මධ්‍යස්ථාන කාර්ය මණ්ඩල පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තු කණ්ඩායම නියෝජනය කළ යුතුය.

- සමාජ සේවා වැඩිහිටි නිවාස, කාර්ය මණ්ඩල, ආබාධිත, විශේෂ අවශ්‍යතා හා ළමා නිවාස ඇතුළු සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ වන සියළු කාර්ය මණ්ඩල කණ්ඩායම නියෝජනය කළ යුතුය.

- උක්ත සඳහන් කළ ආකාරයට හැර ඒ ඒ නිලධාරී කාර්ය මණ්ඩල තමන්ට හිමි කණ්ඩායම හැර වෙනත් කිසිදුකණ්ඩායමකට ක්‍රීඩා කළ නොහැකි අතර, එලෙස වංචා සහගත හෝ වැරදි නියෝජනයක් සිදුවන බව ලියාපදිංචි කරන අවස්ථාවේ හෝ ක්‍රීඩා කරන අවස්ථාවේ හෝ කවර මොහොතක සනාථ වුවහොත් අදාල කණ්ඩායම තරගාවලියෙන් ඉවත් කෙරෙන අතර,

එම කණ්ඩායමට සහභාගී වීමට නියමිත හා /හෝ පැවැත් වූ තරග සියල්ලක්ම ඉවත් කිරීමට හා තරග ප්‍රතිඵල අහෝසි කිරීමට කටයුතු කරනු ලැබේ.

- කණ්ඩායම් තරඟ සඳහා එක් ආයතනයකින් උපරිම වශයෙන් කණ්ඩායම් දෙකකට පමණක් ඉදිරිපත් විය හැකි අතර, එසේ ඉදිරිපත් වන අවස්ථාවකදී A කණ්ඩායම, B කණ්ඩායම ලෙස නම් කර අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, එක් කණ්ඩායමක් තරගාවලිය අතරතුර ඉවත් වුවහොත් එහි සිටි ක්‍රීඩකයන් යොදවා අනෙක් කණ්ඩායමට ක්‍රීඩා කළ නොහැකි අතර, එය ක්‍රීඩා වංචාවක් ලෙස සලකා පියවර ගනු ලැබේ.

- කේවල ඉසව් සඳහා ආයතනයකින් උපරිම වශයෙන් 05 දෙනෙකුට යටත්ව නම් ඉදිරිපත් කිරීමේ හැකියාව ඇතත්, අයදුම්පත්‍ර සලකා බැලීමේ කමිටුවේදී ලැබී ඇති අයදුම්පත්‍ර සංඛ්‍යාව අනුව ආයතනයකට කේවල ඉසව් සඳහා උපරිම වශයෙන් සහභාගි කරවිය හැකි ක්‍රීඩක සංඛ්‍යාව තීරණය කරනු ඇත.

- ජවන හා පිටිය තරඟ සඳහා තරඟ දින උදෑසන සෑම ක්‍රීඩක ක්‍රීඩිකාවකගේම වෛද්‍ය වාර්තා ලබා ගැනීමට නියම කරනු ලැබේ.

- සෑම තරඟයකදීම තරඟකරුවන් තරඟ අවස්ථාවේදී මත්ද්‍රව්‍ය හෝ තහනම් උත්තේජක හෝ භාවිතයෙන් තොරව තරඟ කිරීම අනිවාර්ය වේ.

- අදාල සංවිධායක ආයතන විසින් ඒ ඒ ඉසව්ව සඳහා ඇස්තමේන්තු සකස් කළ යුතු අතර එම ඇස්තමේන්තු සඳහා තීරක කමිටුව මගින් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

- එක් දිනක් තුළ තරඟ ඉසව් කිහිපයක්ම ක්‍රියාත්මක වීමට ඉඩ ඇති බැවින් ඒ ඒ ආයතනයේ බහුතර පිරිසකට නියෝජනය ලැබිය හැකි වන සේ කණ්ඩායම් සැකසීමට වගබලාගත යුතුය.

07. ඒ ඒ ඉසව්ව සඳහා වන මූලික තරඟ නීති රීති, සංවිධානය කළ යුතු ආකාරය හා අයදුම්පත්‍ර ලැබෙන ප්‍රමාණය අනුව තරග කාලසටහන් සැකසීම හා එම ඉසව්ව සඳහා වඩාත්ම යෝග්‍ය වන ක්‍රීඩා පිටි හා පරිශ්‍ර කිහිපයක් යෝජනා කිරීම යනාදී උපදෙස් ලිඛිතව ඒ ඒ සංවිධානය කෙරෙන ආයතනයකට බස්නාහිර පළාත් ක්‍රීඩා අංශය වෙතින් ( කලින් කලට) නිකුත් කෙරෙනු ඇති අතර ඒ අනුව තරඟ සංවිධානය කිරීමට ඒ ඒ සංවිධායක ආයතනය වග බලා ගත යුතුය.

08. සිය ආයතනය නියෝජනය කරමින් ඒ ඒ ඉසව් සඳහා සහභාගි වන කණ්ඩායම් සඳහා ප්‍රවාහන පහසුකම්, සංග්‍රහ කටයුතු හා අනෙකුත් අවශේෂ සුභසාධක පහසුකම් ඒ ඒ ආයතනය විසින් දැරිය යුතු අතර, ඉසව්ව සංවිධානය කරන ආයතනය ඒ සඳහා කිසිදු පිරිවැයක් නොදැරිය යුතුය. එමෙන්ම අදාළ ආයතනයද ඒ සඳහා වියදම් දැරීමේදී පළාත් සභා මූල්‍ය ප්‍රභව කිසිසේත් වැය නොකළ යුතු බවද අවධාරණය කෙරේ.

09. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2023 අගෝස්තු මස 25 දිනට හෝ ඊට පෙර බස්නාහිර පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ, පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය, බස්නාහිර පළාත් සභා සංකීර්ණය, අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් හෝ භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඒ ඒ අයදුම්පත්‍ර පිළිබඳ සලකා බැලීම, ඔවුන් තරග සඳහා ඇතුළත් කිරීම, අභියාචනා වේ නම් ඒ පිළිබඳ සලකා බැලීම, තරග වංචා හා ලියාපදිංචි කිරීම් පිළිබඳ ගැටළු සලකා බැලීම හා තීරණ ලබා දීම, අවසන් ප්‍රතිඵල නිශ්චය කිරීම යනාදියේ අවසන් තීරක බලය ලෙස බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කුසලානය 2023 ක්‍රීඩා තරඟාවලියේ තීරක කමිටුව වෙත පැවරෙන අතර ක්‍රීඩා තරගාවලියට අදාළව විනිශ්චය මණ්ඩල ලබා ගත යුතු ස්ථාන, ක්‍රීඩාංගන වෙන් කළ යුතු ස්ථාන, ඒ ඒ තරග ඉසව්වට අදාළ තරග නීති බස්නාහිර පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ විසින් ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම් අනුමැතියකින් ලබා දෙනු ලබන අතර, වර්ණ රාත්‍රිය පැවැත්වීම, සංවිධාන කටයුතු තීරණය කිරීම, ප්‍රතිඵල සම්බන්ධ අවසන් තීරණ ගැනීම බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ සභාපතිත්වයෙන් යුතු පහත තීරක කමිටුව මඟින් සිදු කෙරෙනු ඇත.

- ප්‍රධාන ලේකම් - සභාපති
- ආණ්ඩුකාර ලේකම්
- ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්
- සභා ලේකම්
- ක්‍රීඩා අධ්‍යක්ෂ
- ආණ්ඩුකාරවර සම්බන්ධීකරණ ලේකම්

10. ඒ අනුව ඒ ඒ ඉසව්වට අදාළ අයදුම්පත්‍ර ලැබීමෙන් පසුව තීරක කමිටුව ඒ ඒ අයදුම්පත්‍ර වෙන් වෙන් වශයෙන් සලකා බලා අනුමැතිය ලබාදීමෙන් අනතුරුව 2023 සැප්තැම්බර් මස සිට තරග ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ. ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව අනුව ඒ ඒ ඉසව් සඳහා පිළිමළුන් පිටු දැකීම, ලීග් ක්‍රමය, හීට් ක්‍රමය යනාදියෙන් වඩාත් සුදුසු ක්‍රීඩා තරග රටාව තීරක කමිටුව විසින් තීරණය කරනු ඇත.

11. 2023 සැප්තැම්බර් මස සිට 2023 නොවැම්බර් මස දක්වා කාලසීමාව තුළ තරග පැවැත්වීමට අපේක්ෂිත අතර, වර්ණ රාත්‍රිය 2023 දෙසැම්බර් මස පැවැත්වීමට යෝජිතය.

12. ඉහත කරුණු වලට යටත්ව තරග අයදුම්පත්‍ර ඉදිරිපත් කර සිය ආයතනයේ නිලධාරීන් මෙම තරග වලට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස සියලුම ආයතන ප්‍රධානීන්ට වගකීම් පවරනු ලැබේ. එම තරග සඳහා සහභාගී වීමේදී හෝ තරග පුහුණුවීම් සඳහා සහභාගී වීමේදී හෝ මහජන සේවා සම්පාදනයට කිසිසේත් බාධාවක් නොවන වගට සියලුම ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය.

13. තරඟ සංවිධානය කරනු ලබන එක් එක් ආයතනයක් සඳහා සම්බන්ධීකරණ නිලධාරියකු පත් කොට ඒ පිළිබඳව 2023 අගෝස්තු 20 දිනට පෙර පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ දැනුවත් කළ යුතුය.

14. මෙම තරඟාවලිය සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය කරුණු ක්‍රීඩා අධ්‍යක්ෂ මගින් දැනගත හැක.

දුරකථන අංකය - 0774402813

15. "බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කුසලානය - 2023" ක්‍රීඩා තරගාවලිය හා වර්ණ රාත්‍රිය සාක්ෂාත් කර ගැනීමට ඔබ සැමගේ සහයෝගය අපේක්ෂා කරමි.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත් : 01. ගරු ආණ්ඩුකාරතුමාගේ පෞද්ගලික ලේකම්
02. ගරු ආණ්ඩුකාරතුමාගේ සම්බන්ධීකරණ ලේකම්, මේජර් ටී.බී ඩයස් මහතා
} කරු.දැ.ගැ.ස සහ අවශ්‍ය කටයුතු සඳහා

## ආණ්ඩුකාරවර කුසලානය - 2023

### තරග අයදුම් පත්‍රය

01. ආයතනයේ නම :

02. ඉදිරිපත් වන තරග ඉසව්ව :

03. ඉසව්ව සඳහා ඉදිරිපත් වන ක්‍රීඩක / ක්‍රීඩිකාවන්ගේ නම / නම් :

| | නම | ජා.හැ.අ. | | නම | ජා.හැ.අ. |
|---|---|---|---|---|---|
| i) | .................................... | ................... | xi) | .................................... | ................... |
| ii) | .................................... | ................... | xii) | .................................... | ................... |
| iii) | .................................... | ................... | xiii) | .................................... | ................... |
| iv) | .................................... | ................... | xiv) | .................................... | ................... |
| v) | .................................... | ................... | xv) | .................................... | ................... |
| vi) | .................................... | ................... | xvi) | .................................... | ................... |
| vii) | .................................... | ................... | xvii) | .................................... | ................... |
| viii) | .................................... | ................... | xviii) | .................................... | ................... |
| ix) | .................................... | ................... | xix) | .................................... | ................... |
| x) | .................................... | ................... | xx) | .................................... | ................... |

සැ.යු.:- පෞද්ගලික ලිපිගොනුව හා සහතික පත්‍රයට අවශ්‍ය ලෙස නම් සඳහන් විය යුතුය.

04. සේවා ස්ථානය පිළිබඳ සහතිකය :

උක්ත නම / නම් සඳහන් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව / ක්‍රීඩකයන් / ක්‍රීඩිකාවන් (අනවශ්‍ය වචන කපා හරින්න) ..........................................................................(ආයතනයේ නම) ට අනුයුක්තව සේවය කරනු ලබන රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ වැටුප් ලබන රාජ්‍ය නිලධාරියෙකු / නිලධාරිනියක / නිලධාරීන් / නිලධාරිනියන් බව සහතික කරමි.

.......................................

ජේ.ස.ලේ./ස.ලේ/අධ්‍යක්ෂ/ නිල මුද්‍රාව :

පරි.නි./ආසන්නතම මාණ්ඩලික නිලධාරී

05. ආයතන ප්‍රධානියාගේ සහතිකය :

උක්ත නම / නම් සඳහන් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව / ක්‍රීඩකයන්/ ක්‍රීඩිකාවන් ............................................ (ආයතනයේ නම ) ට අනුයුක්තව සේවය කරන රාජ්‍ය නිලධාරීන් බවත්, කිසියම් වැරදි සහගත තොරතුරක් හෝ අප ආයතනයේ සේවය කරනු නොලබන හා "ආණ්ඩුකාරවර කුසලානය" තරගාවලියේ තරග නීති රීති යටතේ අප ආයතනයට ක්‍රීඩා කළ නොහැකි යම් අයෙකුගේ නමක් මෙහි ඇතුලත්ව නොමැති බවත් තහවුරු කරමි. ආණ්ඩුකාරවර කුසලානයේ තරග ඉසව් නීති රීති දැනුම්වත් බවත්, එම නීති රීති වලට යටත්ව තරග වැදීමට එකඟ බවත් දැනුම් දෙමි.

.......................................

ආයතන ප්‍රධානී:

දිනය :

---

**කාර්‍යාලීයප්‍රයෝජනය සඳහා පමණි**

ක්‍රීඩා අධ්‍යක්ෂ (බ.ප.)
ක්‍රීඩා අමාත්‍යාංශය

උක්ත ආයතනයේ සහතික කරන ලද ක්‍රීඩක / ක්‍රීඩිකාවන් බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කුසලානය - 2023 සඳහා ඇතුළත් කර ගැනීම අනුමතයි.

.......................................

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.